ඉපලෝගම ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව 2020 සැප්තැම්බර් 04 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රචාරක දැන්වීම් පුවරු හිඟ ආදායම් රු.60,800 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියළු ආදායම් ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.11,767,074 ක් වූ ගබඩා සංකීර්ණ ගොඩනැගිලි අළුත්වැඩියා සහ ප්‍රතිසංස්කරණ වියදම තුල ඇතුළත් මූලධන වටිනාකම් හඳුනාගෙන ප්‍රාග්ධන ගතකර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් හඳුනා ගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. |
| (iii) | මහ ඉලුප්පල්ලම ගබඩා සංකීර්ණයේ ජල පහසුකම් සකස් කිරීම වෙනුවෙන් දරා තිබුණු රු.400,543 ක වටිනාකම ප්‍රාග්ධනගත කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් හඳුනා ගෙන ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. |
| (iv) | ප්‍රාදේශීය සභාවට අයත් සිරික්කුලම සහ කඩියන්ගල යන ස්ථානවල රු.2,720,000 ක් වූ ගොඩනැගිලි සහ ජල පෙරන පද්ධතීන් ප්‍රාග්ධනගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාගාර සහ භූමිවල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවේ. | පිළිගනිමි. |
| (vi) | ප්‍රාදේශීය සභා පුස්තකාලවල යටිතල පහසුකම් සංවර්ධනය 2017 වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.99,120 ක් කර්මාන්ත ණයගැති යටතේ දක්වා තිබුණද එයට අදාලව ගෙවිය යුතු වටිනාකම කර්මාන්ත ණයහිමියන් යටතේ දක්වා නොතිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වේ. | පිළිගනිමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------------ | ----------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.560,637 ක්වූ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ බැරකම් වසර 05 ක් ඉක්මවූ කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට පියවර ගත යුතු වේ. | ගෙවිය යුතු පුද්ගලයන් පිළිබඳ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සොයා බලා අදාල මුදල නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව සටහන් කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | -------------------------- |
| වටිනාකම රු.176,202,210 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 134 වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් දියුණු කල ප්‍රදේශ ගැසට් කර වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහය | | | |
| රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන සහ අමාත්‍යාංශ ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ | | | |
| අංක 06හි 2.2(iii) | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. සභාවට අයත් මාර්ග ගැසට් කර නොතිබුණු අතර ගෙනයා හැකි උපරිම බර ප්‍රදර්ශනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,087,386 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,544,143 ක් විය.

### 2.2 ආදායම්පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් හා හිඟ ආදායම් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,436,800 | 2,666,850 | 2,462,675 | 1,007,362 | 1,307,700 | 1,745,687 | 1,241,763 | 803,187 |
| (ii) | කුලී | 4,219,676 | 3,441,061 | 3,467,357 | 497,349 | 982,680 | 3,191,475 | 1,201,930 | 523,645 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 238,000 | 223,550 | 223,550 | - | 2,550,790 | 1,036,380 | 2,533,483 | - |
| (iv) | වෙනත් ආදායම් | 6,398,646 | 8,007,802 | 9,028,664 | 6,824,802 | 5,585,936 | 9,490,434 | 11,786,029 | 7,845,664 |
| | | 13,293,122 | 14,339,263 | 15,182,246 | 8,329,513 | 10,427,106 | 15,463,976 | 16,763,205 | 9,172,496 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට හිඟහිටි කසල බදු ආදායම රු.1,007,362 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

#### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු කුලී ආදායම රු.120,803 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.4,766,402 ක් හා මුද්දර ගාස්තු රු.2,058,400 ක් විය. | නිරවුල් කර අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අදාල කාරණාවලට අතුරු ව්‍යවස්ථා පැනවීමට අදාලව උතුරු මැද පළාත් සභාව මගින් අනුමත කල අතුරු ව්‍යවස්ථා 10 මෙම ප්‍රාදේශීය සභාව සඳහා වැළද ගැනීම සිදුකර ඇති බව සටහන් කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසර සංවර්ධන ඉලක්කයන් පිහිටුවා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් වී එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී අවම ලංසු වටිනාකම රු.142,650 ක් වූ ටෙන්ඩර් බදු ලබාදිය හැකි දේපල 10 ක් බදු දීමට නොහැකි වීමෙන් සභාවට අයකරගත හැකිව තිබුණු එම ආදායම අහිමි වී තිබුණි. | බදුදිය හැකි සියළු වත්කම් බදුදී ටෙන්ඩර් ආදායම් ඉහළ නැංවීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩාගාර සහ ක්‍රීඩාගාර භූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ක්‍රීඩා භූමි පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | සභාව විසින් භාවිතා කරනු ලබන රු.13,571,373 ක් වූ වාහන හා යන්ත්‍රෝපකරණ 03 ක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | අදාල වත්කම් පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

3.3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු වටිනාකම රු.3,264,000 ක් වූ වාහන 05 ක් වසර 03 ක් ඉක්මවූ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | අදාල වත්කම් භාවිතයට ගැනීම හෝ භාවිත කළ නොහැකි වත්කම් විධිමත්ව වෙන්දේසි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |